සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

# ක්‍රිස්තු ධර්මය

08 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

### I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. 'තිබේරියස් මුහුද' හඳුන්වන තවත් නමක් වන්නේ,
(1) කළු මුහුද ය. (2) රතු මුහුද ය. (3) ගලීල මුහුද ය. (4) මධ්‍ය ධරණීය මුහුද ය.

02. 'ජේසුගේ ප්‍රේමේ - විශාල පුදුමය වේ.' ගීතිකාව නිර්මාණය කළේ,
(1) එලීසා ඇග්නිව් ය. (2) ජොයිස් ද සිල්වා ය.
(3) මයිකල් රොද්‍රිගු පියතුමා ය. (4) මර්සලින් ජයකොඩි පියතුමා ය.

03. ජේසුස් වහන්සේ ආබ්‍රහම්ගේ පුත්‍රයෙක් ලෙස හැඳින්වූයේ,
(1) පේදුරු ය. (2) සකෙවුස් ය. (3) මතෙව් ය. (4) යොහාන් ය.

04. ලංකා සභාවේ කුරුණෑගල දියෝකිසියේ තුන්වන බිෂොප්තුමා ලෙස හඳුන්වන්නේ,
(1) ගෞරවනීය සෝමසිරි කුමාරදාස් පෙරේරා පියතුමන් ය.
(2) වන්දනීය විනයාචාර්ය ඩොනල්ඩ් කනගරත්නම් පියතුමන් ය.
(3) අතිගරු ලක්දාස ද මෙල් හිමිතුමන් ය.
(4) අතිකරු ඇන්ඩෲ කුමාරගේ හිමිතුමන් ය.

05. දරුවෙකු දෙවියන් වහන්සේ පිළිබඳ ප්‍රථම අත්දැකීම ලබන්නේ,
(1) නිවසේ දී ය. (2) පෙර පාසලේ දී ය.
(3) දේවස්ථානයේ දී ය. (4) පාසලේ දී ය.

06. ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශය කරා යෑමේදී මග පෙන්වූයේ,
A - ගිනි ටැඹකිනි. B - වලා ටැඹකිනි. C - තාරකාවකිනි. D - වැලි ටැඹකිනි.
ඉහත සඳහන් වරණ අතරින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,
(1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) C හා D ය.

07. ශුද්ධාත්ම ඵල පමණක් අඩංගු වරණය වන්නේ,
(1) සාමය හා යාච්ඤාව යි. (2) ප්‍රීතිය හා දිවැසිවැකි කීම යි.
(3) ප්‍රේමය හා ප්‍රීතිය යි. (4) සාමය හා යාච්ඤාව යි.

08. දෙවියන් වහන්සේ මිනිසාගේ භෞතික ශරීරය නිර්මාණය කිරීමට යොදා ගත්තේ,
(1) වාතය ය. (2) මැටි ය. (3) යකඩ ය. (4) දූවිල්ල ය.

09. මිනිසා දේව මැවිල්ලේ,
(1) භාරකරු ය. (2) අයිතිකරු ය. (3) නිර්මාණකරු ය. (4) උරුමකරු ය.

10. දෙවියන් වහන්සේ ලබාදුන් නිදහස මිනිසා යොදා ගත්තේ,

A - යහපත තෝරා ගැනීම සඳහා ය. B - අයහපත තෝරා ගැනීම සඳහා ය.

C - දෙවියන් වහන්සේට අවනත වීම සඳහා ය. D - දෙවියන් වහන්සේ හා සමාන වීම සඳහා ය.

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) B හා D ය.

11. ජේසුස් වහන්සේ කුඩා කළ හැදී වැඩුණේ,

(1) ගලීලයේ ය. (2) සමාරිතයේ ය. (3) නාසරෙත් නුවරය. (4) ජෙරුසලම් නුවර ය.

12. බදු පොළේ සිටිය දී ජේසුස් වහන්සේට හමු වූ ගෝලයා,

(1) ජාකොබ් ය. (2) ඇන්ඩෘ ය. (3) මතෙව් ය. (4) ජොහන් ය.

13. ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන් තෝරා ගත්තේ,

(1) තරාතිරම් සැලකිල්ලට ගැනීමෙනි. (2) බුද්ධි මට්ටම සැලකිල්ලට ගැනීමෙනි.

(3) රැකියාව සැලකිල්ලට ගැනීමෙනි. (4) කිසිවක් සැලකිල්ලට නොගැනීමෙනි.

14. ප්‍රථම ධර්මදූත මෙහෙවර යොමු කරනු ලැබූයේ,

(1) සමරිතයන්ට ය. (2) විජාතීන්ට ය.

(3) සමාරිකයන් හා විජාතීන්ටය. (4) ඊශ්‍රායෙල් වංශයේ නැතිවූ බැටළුවන් වෙතය.

15. තම ලෞකික කටයුතු පසෙකලා ජේසුස් වහන්සේගේ පාද පාමුල සිටිමින් දේව වචනය ඇසීමට යොමු වූ කාන්තාව වන්නේ,

(1) මාර්තා ය. (2) මරියා ය. (3) ජොවන්නා ය. (4) සුසානා ය.

16. ක්‍රිස්තුස් වහන්සේ සමඟ ඇති දේව සබඳතාව වර්ධනය කර ගැනීම සඳහා කළ යුත්තේ,

(1) අන් අය සමඟ සාකච්ඡා කිරීම. (2) වන්දනා ගමන්වල නිරත වීමය.

(3) දේව වචනය කියවමින් යාච්ඤා කිරීමය. (4) දේවස්ථානයේ ශ්‍රමදානවලට සහභාගී වීම ය.

17. ජීවිතයේ සෑම තත්ත්වයක් තුළ දී ම දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ශක්තිමත්ව සිටීමට පොළඹවන ශුද්ධාත්ම ඵලය වන්නේ,

(1) මෘදුකම ය. (2) යහපත්කම ය. (3) විශ්වාස ය. (4) ප්‍රේමය ය.

18. ආදි මව්පියන් පාපයට වැටීමෙන් අහිමිකරගත්තේ,

(1) දේව රාජ්‍යය ය. (2) සදාකාල ජීවිත ය.

(3) මරණය ය. (4) දේව දරුකම ය.

19. "ජේසුස් වහන්සේ මෙලොව කළ සේවයේ දී නිතර අසරණ අයට ....... ' මෙහි හිස්තැනට වඩාත් උචිත පිළිතුර වන්නේ,

(1) පිහිට වූ සේක. (2) පීඩා කළ සේක.

(3) අගය කළ සේක. (4) ප්‍රතික්ෂේප කළ සේක.

20. කිතුනු දරුවෙකු වන ඔබට මේ දක්වා ලැබූ සියලු ආශිර්වාද ලැබුණේ,

(1) ඔබගේම හැකියවන් තුළින් ය. (2) ඔබගේ ම බුද්ධිය තුළින් ය.

(3) දෙමාපියන්ගේ ධනවත්කම තුළින් ය. (4) දෙවි පියාණන් තුළින් ය.

(ලකුණු 02 x 20 = 40 )

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. **කෙටි පිළිතුරු සපයන්න.**
  (i) ශුද්ධාත්ම දීමනා 02 ක් ලියන්න.
  (ii) ශුද්ධ වූ ජොහාන් සුබාරංචියට අනුව දෙවියන් වහන්සේ මිනිසාට කොපමණ ප්‍රේම කළ සේක්ද?
  (iii) සදාතන ජීවිතය අහිමි කර ගැනීම නිසා මිනිසාට අත්විඳීමට සිදු වූ ගැටලු 02 ක් ලියන්න.
  (iv) 'ගැලවීම අද මේ ගෙදරට පැමිණ ඇත.' මෙම ප්‍රකාශය කවුරුන් විසින් කා හට ඉදිරිපත් කරන ලද්දක්ද?
  (v) ක්‍රිස්තුස් වහන්සේ පව්කරුවා නොව පාපය ප්‍රතික්ෂේප කළ අවස්ථා 02 ක් නම් කරන්න.
  (vi) ගෝලයන් දොළොස්දෙනා පිටත් කර යැවීමේදී දුන් උපදෙස් 02 ක් ලියන්න.
  (vii) ජේසුස් වහන්සේ දරුවන්ට සුවය සහ සහනය දුන් අවස්ථා 02 කට උදාහරණ ලියන්න.
  (viii) ජේසුස් වහන්සේගේ ගෝලයන් අතර දේව කැඳවීමට ක්ෂණිකව පිළිතුරු දුන් ගෝලයා ලෙස හැඳින්විය හැක්කේ කුමන ගෝලයාද? (ල. 2x08=16)

02. (i) යහපත් බැටලු එඬේරෙකුගේ ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 02)
  (ii) ජේසුස් වහන්සේ යහපත් බැටලු එඬේරෙකු ලෙස සැලකීමට හේතු 03 ක් ලියන්න. (ල. 03)
  (iii) ඔබ ජේසුස් වහන්සේ අනුගමනය කරන අයෙකු ලෙස ඔබේ එඬේරික කාර්ය කුමක්දැයි කරුණු 06 කින් පැහැදිලි කරන්න. (ල. 06)

03. (i) 'මහජනයා මා කවරෙකැයි කියා කියද්දැයි' ජේසුස් වහන්සේ ඇසූ ප්‍රශ්නයට පේදුරු දුන් පිළිතුර කුමක්ද? (ල. 02)
  (ii) ජේසුස් වහන්සේ හා පේදුරු අතර සංවාද ඇති වූ අවස්ථා වලට උදාහරණ 03 ක් ලියන්න. (ල. 03)
  (iii) පන්ති නායකයෙකු ලෙස ඔබට පේදුරුතුමාගෙන් ගත හැකි ආදර්ශ මොනවාද? (ල. 06)

04. (i) ඉව්ලින් කානි විසින් අනාථ දරුවන් හා වැඩිහිටියන් සඳහා නිර්මාණය කළ නිවාස 02 නම් කරන්න. (ල. 02)
  (ii) අතිගරු ඇන්ඩෲ කුමාරගේ හිමිතුමන්ගේ සේවය පිළිබඳ කරුණු 03 ක් ලියන්න. (ල. 03)
  (iii) අපට ලැබී ඇති විවිධ දීමනා යොදාගෙන ශුද්ධ සභාව වෙනුවෙන් කළ හැකි සේවා 06 ක් ලියන්න. (ල. 06)

05. (i) වර්ධනය වෙමින් පවතින ඊශ්‍රායෙල් ජනතාව පාලනයට පාරාවෝ ගත් ක්‍රියාමාර්ග 02 ක් ලියන්න. (ල. 02)
  (ii) පාරාවෝගෙන් මිදී පොරොන්දු දේශය කරා ගමන් කිරීමේදී දෙවිඳුන්ගේ පෝෂණයට ලැබූ අවස්ථා 03 ක් ලියන්න. (ල. 03)
  (iii) වර්තමාන මිනිසා අද වහල් වී සිටින දේවල් 03 ක් නම් කර ඉන් මිදීමට ඔබ කරන යෝජනා 03 ක් ලියා දක්වන්න. (ල. 06)

06. (i) ජේසුස් වහන්සේ තම ප්‍රථම ධර්ම දේශනාව සඳහා යොදාගත් දිවැසිවරය ග්‍රන්ථය කුමක්ද? (ල. 02)
  (ii) ඉහත සඳහන් කළ දිවැසිවර ග්‍රන්ථයේ ක්‍රිස්තුස් වහන්සේගේ මෙහෙවර පිළිබඳ සඳහන් වන කරුණු 03 ක් ලියන්න. (ල. 03)
  (iii) ඔබට පන්තිකාමරය තුළ දී ක්‍රිස්තුස් වහන්සේගේ මෙහෙවරට ඔබ දායක විය හැකි අවස්ථා 06 ක් ලියන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 3 )  02. ( 2 )  03. ( 2 )  04. ( 4 )  05. ( 1 )  06. ( 1 )  07. ( 3 )  08. ( 4 )  09. ( 1 )  10. ( 4 )
11. ( 3 )  12. ( 3 )  13. ( 4 )  14. ( 4 )  15. ( 2 )  16. ( 3 )  17. ( 3 )  18. ( 2 )  19. ( 1 )  20. ( 4 )

## II කොටස

01. (i) නිවැරදි ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනා සලකා බලා ලකුණු දෙන්න.
(ii) ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් ලොවට දෙන තරම් ප්‍රේම කළ සේක.
(iii) ♦ මහන්සි වී වැඩ කිරීම. ♦ ස්ත්‍රීය සැමියාගේ පාලයට නතුවීම. ♦ දරුවන් විළිරුදාව සහිතව බිහි කිරීම.
(iv) ජේසුස් වහන්සේ විසින් සකෙවුස්ගේ නිවසෙහි සිටි පිරිසට
(v) පව්කාර ස්ත්‍රීය, සකෙවුස්
(vi) රන්, රිදී, තඹ කාසි හෝ ගමන් මල්ලක්වත්, කමිස 2 ක් වත්, පාවහන් සගලවක්වත්, සැරයටියක්වත් රැගෙන නොයන්න.
(vii) මීමැස්මොර රෝගී දරුවා, යායිරස්ගේ දියණිය
(viii) ලෙවී හෙවත් මතෙව් ය. (ල. 2x08=16)

02. (i) ♦ ඉදිරියෙන් ගමන් කරයි. ♦ නොමග යන විට නිවැරදි මාර්ගයට යොමු කරයි. ♦ දුබල වූ විට ඔසවා ගෙන ගොස් නිසිතැන රඳවයි. (ල. 02)
(ii) ♦ නිවැරදි මාර්ගයට මිනිසුන් යොමු කිරීම. ♦ පෝෂණය ලබා දීම. ♦ නව ජීවිතය තම බැටලුවන් උදෙසා පූජා කිරීම. (ල. 03)
(iii) ♦ දේව වචනය තුළ සවිමත් වෙමින් අන් අය පෝෂණය කිරීම. ♦ නිරතුරුව යාච්ඤා කිරීම හා අන් අය ඒ අනුව දිරිමත් කිරීම. ♦ ජීවිතාදර්ශය තුළ අන් අය දෙවිදුන් වෙත ගෙන ඒම වැනි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 06)

03. (i) 'ඔබ දෙවියන්වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ ය.' (ල. 02)
(ii) ♦ ධර්මදූත කාර්යයට සූදානම් කිරීමේදී. ♦ ක්‍රිස්තුස් වාහන්සේ පාවා දුන් අවස්ථාවේ නොහඳුනන බව ප්‍රකාශ කරයි. ♦ තමා මරණයට පවා සූදානම් බව පැවසීම. ♦ මුල් ගෝලයන් කැඳවන අවස්ථාවේ. (ල. 03)
(iii) ♦ නිසි මඟ පෙන්වීම. ♦ ජීවිතාදර්ශය තුළ කටයුතු කිරීම. ♦ අභියෝග හමුවේ ඉදිරියට යෑම.... වැනි නිවැරදි පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න. (ල. 06)

04. (i) ♦ අනාථ දරුවන් - ප්‍රීති නිවාස ♦ වැඩිහිටි නිවස - සන්ධ්‍යාව (ල. 02)
(ii) පෙළ පොතේ 55 වන පිටුවේ සඳහන් කරුණු අනුව ලකුණු දෙන්න. (ල. 03)
(iii) ගායන, වාදන, දේශනා කිරීම, ඉගැන්වීම ආදී දීමනා, ගීතිකා කණ්ඩායම, දහම් පාසල උදෙසා කැප කිරීම වැනි පිළිතුරු සඳහා ලකුණු දෙන්න. (ල. 06)

05. (i) ♦ වින්නඹුවන් ලවා දරුවන් විනාශ කිරීම. ♦ දරුවන් නයිල් ගඟට විසි කිරීම. ♦ බර වැඩ ගැනීම. (ල. 02)
(ii) ♦ මන්නා හා වටුවන් ලැබීම. ♦ 'මාරා' හි ද ජලය ලැබීම. ♦ හොරෙබ්හි පර්වතයෙන් ජලය ලැබීම. (ල. 03)
(iii) මත්ද්‍රව්‍ය, බලය, ධනය, ආශාවන් වැනි වහල් බාවයන් හා ඉන් මිදීම පිළිබඳ ශිෂ්‍ය යෝජනා අනුව ලකුණු දෙන්න. (ල. 06)

06. (i) යෙසායා දිවැසිවර ග්‍රන්ථය (ල. 02)
(ii) දිළිඳුන්ට සුබාරංචි ප්‍රකාශ කිරීම, මහලුන් මිදීම, අන්ධයන්ට පෙනීම.... (ල. 03)
(iii) ශිෂ්‍ය කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)